# ලෝකයේ මාතෘවංශික ජන සමාජ

රශ්මිලා විදුලානි බණ්ඩාර

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
vidublue7@gmail.com

---

මාතෘමූලික සමාජයක දේශපාලන නායකත්වය ස්ත්‍රියක විසින් දරණු අතර ඇතැම් විට දේශපාලන නායකත්වය පුරුෂයකු විසින් දරණු ලැබුව ද නිවසේ නායකත්වය ස්ත්‍රියක විසින් දරණු ලබන මාතෘමූලික සමාජ ද තිබිය හැකි ය. පීතෘමූලික සමාජයේ මෙන් නොව මාතෘමූලික සමාජයේ මාතෘ මූලිකත්වය හා මාතෘ වංශිකත්වය අතර බැඳීමක් නොමැත. මාතෘමූලික සමාජයක් මාතෘවංශික විය නොහැකි අතරම මාතෘවංශික සමාජයක් මාතෘමූලික නොවී මේ හැකියාවක් ද පවතියි. කෙසේ වෙතත් ඉහත සමාජ ද්විත්වය සමගම පොදුවේ මාතෘවාසික සංකල්පය ක්‍රියාත්මක වේ.

ඉහත සඳහන් කරුණු අතරින් මෙම ඉදිරිපත් කිරීමට අදාළවන්නේ මාතෘවංශික සමාජය (Matrilineal Society) පිළිබඳවය. පර්යේෂණයේ අරමුණ වූයේ ලෝකයේ වෙසෙන්නා වූ විවිධ වූ ජන වර්ග සියල්ලම පීතෘවංශික සමාජ ක්‍රමයක් තුළ වෙසෙන්නේ ද නැද්ද යන්න අධ්‍යයනය කිරීමය. මේ සඳහා ක්ෂේත්‍ර නොවන ගවේෂණය මගින් ග්‍රන්ථ සහ අන්තර්ජාල භාවිතය තුළින් දත්ත රැස්කර ගනු ලැබිණි.

මාතෘවංශික සංකල්පයෙන් අදහස් වන්නේ 'මවගේ පෙළපත, වංශය හෝ ගෝත්‍රය දරණ' නොඑසේ නම් 'පෙළපත ස්ත්‍රී පුරුක් හරහා ගලා යන' යන අරුත ය. එනම් මවගේ වාසගම භාවිත කරන, දේපල උරුමය හා ගෘහ මූලිකත්වය මවගෙන් දියණියට උරුම වන සමාජ සංකල්පය ය. මාතෘවාසික සංකල්පයෙන් අදහස් වනුයේ විවාහයෙන් පසු පදිංචි ස්ථානය බිරිඳගේ නිවස වන බව ය. මාතෘවංශික සමාජ බිහිවීමට බලපාන සාධක කිහිපයක් ඇත. ඉන් ප්‍රධානතම සාධකය විවාහය වේ. මාතෘවංශික සමාජ, සම්පූර්ණයෙන් වර්ධනය නොවූ විවාහ ක්‍රම හේතුවෙන් ඇති වේ. බොහෝමයක් මාතෘ මූලික සමාජ දක්නට ලැබෙන්නේ වනචාරි (savage) සමාජවලය. මාතෘ වංශික සංකල්පය පවතින ජන කණ්ඩායම් පිළිබඳව සියුම්ව විශ්ලේෂණය කිරීමේදී ඒ සෑම සමාජයකටම පොදු වූ කරුණු කිහිපයක් හඳුනාගනු ලැබිණි. ඉන් ප්‍රධාන කරුණක් වන්නේ සෑමවිටම ගෘහ මූලික තනතුර හිමිවන්නේ පවුලේ වැඩිමල් කාන්තාවට ය (Matriarch).. විවාහය මාතෘවංශික සමාජයේ වැදගත් සංකල්පයකි. විවාහයෙන් පසු මනාලිය මනාලයාගේ නිවසට යනු වෙනුවට මනාලයා මනාලියගේ නිවසේ වාසය කිරීම සිරිත ය. ශ්‍රී ලංකාවේ මෙය බින්න විවාහ ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. දරුවන් තම මවගේ පෙළපත් නම ගන්නා අතර ඇගේ වංශයට (Clan) අයත් වේ.

මෙම පර්යේෂණය තුළින් පීතෘවංශික සමාජ ක්‍රමයන් පමණක් නොව සුලභ නොවන නමුත් මාතෘවංශික සමාජ ක්‍රමයන් ද පවතින බව තහවුරු විය. බොහෝ විට එතරම් නොදියුණු ප්‍රාථමික ජන සමාජයන්හි මාතෘවංශික සංකල්පය පවතින බව පැහැදිලි විය. ඉරකස්, නවාජෝ, නායර්, අකාන් ආදී ගෝත්‍රික සමාජ මෙයට නිදසුන් වේ. ශ්‍රී ලංකාවේ ද මෙවන් ලක්ෂණ පවතින බව හඳුනාගත් අතර මෙම පර්යේෂණය හරහා ශ්‍රී ලංකාවේ ස්වදේශික ජනයා අතර මෙන්ම ක්‍රමයෙන් අභාවයට යමින් උඩරට සිංහල ජනයා අතරත් මාතෘවංශික සමාජ ක්‍රමය පවතින පැහැදිලි විය.

ප්‍රමුඛ පද : පීතෘමූලික, මාතෘමූලික, මාතෘවංශික, මාතෘවාසික, වංශය